**ශීර්ෂය -259 - මාතලේ  දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට  මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, මෙම වාර්තාවේ 1.6 (අ) හි සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්තාවේ 1.6 (අ) ඡේදයේ මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු වෙනත් යන්ත්‍ර හා උපකරණවල අවසාන ශේෂයන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී රු.181,046 ක වෙනසක් පැවතුණි. | මෙම දෝෂයන් මින් ඉදිරියට සිදු නොවීමට නිලධාරීන් දැනුවත් කළ බව. | ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ (SA -82) වෙනත් යන්ත්‍ර හා උපකරණ වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇති මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.1,792,665 ක වියදමක් දරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වියදම් ප්‍රකාශනය අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණු මුදල රු.1,964,341 වූයෙන් රු.176,676 ක වෙනසක් පැවතුණි. | රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වත්කම් ගොනු සකස් කිරීමේදී සිදුවූ දෝෂයක් බව. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1646 වන රෙගුලාසිය | - | දිස්ත්‍රික් සමෘද්ධි අංශයට අයත් වාහන 03ක දෛනික ධාවන සටහන් වසර 10 ක කාලයක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් විගණනයට ලබා දීමට දැනුම් දී ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | | |
| | (i) 2012 ජූලි 24 දිනැති අංක HAF -3-MISCL-08-08 දරන ලිපියේ 1.7 ඡේදය | - | සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම මාස 03කට වරක්වත් පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු වුවද, මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කාර්යාල 24 ක් හා සංවර්ධන නිලධාරී කාර්යාල 12 ක් එලෙස පරීක්ෂාවට ලක්කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට වාර්ෂික සැලසුම් සකස්කර පරීක්ෂාවන් සිදුකිරීමට දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) 2021 අගෝස්තු 13 දිනැති අංක 08/2021 දරන චක්‍රලේඛයේ 04 ඡේදය හා 2011 මාර්තු 31 දිනැති අංකHAF-2/19/MGTCM/15/1907 දරන ලිපියේ 02 ඡේදය | 170,300 | පුරප්පාඩු පවතින කාර්යාලවල වැඩ බැලීමට පත්කළ නිලධාරීන් සඳහා ගමන්වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම් නොකළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක හා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ වැඩබලන නිලධාරීන් 07ක් වෙත සංයුක්ත දීමනා හා ගමන් වියදම් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට යටත්ව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (iii) 2021 ඔක්තෝබර් 06 දිනැති අංක 20/2021 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | - | සියලු ප්‍රභවයන්ගේ ආදායම් රජයේ ආදායමට බැර කළ යුතු වුවත් දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ පවත්වාගෙන යන ආපනශාලාවේ කුලිය ලෙස මාසිකව රු. 92,000 බැගින් මුදලක් සුභ සාධක සංගමයට ලැබී තිබුණද එයින් කිසිදු මුදලක් රජයේ ආදායමට බැර කර නොතිබුණි. | ගොඩනැගිලි තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව හා එම තක්සේරුව ලද පසු කුලිය රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2023 සැප්තැම්බර් 19 දිනැති අංක 2023/04 දරන ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛයේ 1 ඡේදය | - | 2024 වර්ෂය සඳහා දිස්ත්‍රික්කයේ සියලුම ගිනි අවි බලපත්‍ර 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රථම අලුත් කිරීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණද ගලේවෙල, දඹුල්ල හා අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුද්ගලයින් 60 දෙනෙකු 2024 පෙබරවාරි වන විටත් ගිනි අවි බලපත්‍ර අලුත් කර නොතිබුණි. | ඉදිරිකාලයේදී නියමිත බලපත්‍ර ගාස්තුව හා දඩ මුදල අයකරගන්නා බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 වගන්තිය හා 2021 ජනවාරි 21 දිනැති අතිරේක 38 මඟින් සංශෝධිත 9.3 වගන්තිය | - | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ්රථයක් රු.1,366,280 ක වියදමක් දරා අලුත්වැඩියා කර තිබුණි. | ලක්ෂ 05ට අඩු මුදලක් වැය වෙතැයි අපේක්ෂා කර එන්ජිම ගලවා පරික්ෂා කර බැලීමේදී අමතර අලුත්වැඩියාවක් පැන නැගීම හා ඒ සඳහා වෙනම මිල කැඳවීමක් සිදුකළ නොහැකි බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2.2 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බිරිඳවෙල සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ සිදුකර තිබුණු රු.4,590,500 ක මූල්‍ය වංචාව සම්බන්ධව 2023 දෙසැම්බර් 31 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විමර්ශනයේ වර්තමාන තත්ත්වය පිලිබඳ තොරතුරු ලබාදෙන ලෙස සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් හා විශේෂ අපරාධ විමර්ශන අංශය වෙත ඉල්ලීම් කර ඇති බව. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෝක ආහාර වැඩසටහන යටතේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.462,327 ක වියදමකින් ඉදිකර ප්‍රතිලාභියෙකු වෙත ලබාදී තිබුණු දුම්කරවල මධ්‍යස්ථානය හා සහල් ඇඹරීමට අවශ්‍ය බොයිලේරුවක් සකස්කර ගැනීම සඳහා පුද්ගයකුට ලබාදී තිබුණු රු.350,000 ක උපකරණ 2024 ජනවාරි 18 දින වන විටත් නිෂ්කාර්යයව පැවතුණි. | දුම් කරවල නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන ඉදිරියේ දී සක්‍රීය කර ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු අතර සෘජු අධීක්ෂණක් පවත්වා ගතයුතුය. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදාවට පත් පුද්ගලයින් නැවත පදිංචි කිරීම වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා 2018 -2021 කාලය තුළ රු. 5,400,000 ක ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් 06 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිම කර නැවත පදිංචි කරවීමට කටයුතු කර නොතිබුණි. | ගෙවන ලද වාරිකයට අදාළ ඉදිකිරීම් සිදුකරන තෙක් ඊළඟ වාරික නිදහස් කළ නොහැකි බව හා ප්‍රතිලාභීන් වෙත නිරන්තර උපදෙස් ලබාදී ඇති බව. | ප්‍රතිපාදිත මුදල්වලින් අපේක්ෂිත ප්‍රගතිය ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කර්මාන්ත අමාත්‍යාංශයෙන් 2022 ඔක්තෝබර් 27 දින ලැබුණු රු.15,904,651 ක මුදල් භාවිතා කර ඇඹුල්අඹේ කර්මාන්තපුරයේ වැට ඉදිකිරීම අදියර - Iහි වැඩ 2022 දෙසැම්බර් 29 දිනට අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන්දින වන විටත් වැඩ අවසන් නොකර රු.6,774,590 ක ඉතිරි මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. වැට ඉදිකිරීම II වන අදියරෙහි වැටෙහි දිග මීටර් 38.6 ක් ඉටු නොකර ඒ සඳහා රු. 127,380 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. වැට | ඉඩමේ මායිම් පිළිබඳ ගැටළු ඇති බැවින් පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති බවත් කර්මාන්ත අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කර එකඟතාවයට පැමිණීමට නියමිත බව. | සක්‍යතා අධ්‍යයනය කර අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුව වැඩ අවසන් කර ඉටුකල වැඩ සඳහා ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර, අදියර 02 ක් යටතේ වැට ඉදිකිරීම හේතුවෙන් පළමු අදියර යටතේ කර්මාන්ත පුරයේ අභ්‍යන්තරය හරහා මීටර් 340 කවැට ඉදිකිරීම සඳහා වැය කර තිබුණු රු.1,700,000 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි. | | |
| (ආ) | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම (B -කොටස 6 වන අදියර) ව්‍යාපෘතියේ විෂයයන් 19 ක වැඩ ආරම්භ කර හෝ නොතිබියදී හා ඉටු නොකල වැඩ විෂයන් 04 ක් සඳහා ඉටුකළ බවට බිල්පත් නිර්දේශ කර රු. 1,585,976 ක් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ කාර්යසාධන සුරක්ෂණය 2024 ජනවාරි 15 දිනෙන් අවසන් වී තිබුණු අතර වැඩ අවසන් කළ යුතු දිනය 2023 දෙසැම්බර් 11 වුවත් 2024 පෙබරවාරි 05 දින වන විටත් වැඩ අවසන් නොකිරීම හේතුවෙන් රු.814,165 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | සීමිත කාලයක් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හෙයින් යම්යම් අඩුපාඩු පිළිබඳ ගැටළු පැවති බව. | නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුව වැඩ අවසන් කල වැඩ සඳහා ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ "අතිරේක වැඩ නිමකිරීම්" ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 11 ක් සඳහා රු.1,504,218 ක් ගෙවා තිබුණද එම වැඩ විෂයයන් සිදුකර නොතිබුණි. කාර්යසාධන සුරක්ෂණය2024 ජනවාරි 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණු අතර 2023 දෙසැම්බර් 28 දින වන විට අවසන් කළ යුතු වුවද2024 පෙබරවාරි 05 දින වන විටත් වැඩ අවසන් නොකිරීම හේතුවෙන් රු.164,717 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | අවසන් බිල්පත් ගෙවීමේදී විශේෂ රැඳවුම් මුදලක් රඳවා ගැනීමට කටයුතු කර ඇති බැවින් දෝෂ පවතීනම් එමගින් නිවැරදි කර ගන්නා බව. | නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුව වැඩ අවසන් කර ඉටුකල වැඩ සඳහා ගෙවීම් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අයත් වාහන 09 ක් වසරකට වැඩි කාලයක සිට නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | අදාල ආයතන දැනුවත් කර ඇති බව | උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය . |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 20 දිනැති අංක 01/2022 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදයේ IV වන වගන්තියට පරිභාහිරව කටයුතු කර අඹන්ගඟ හා ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විදේශගත | නැවත අයකරගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාමිකයින් 03 කු සඳහා ජීවන වියදම් දීමනාව රු.117,450 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතලේ දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු 11ක නියැදියක් පරික්ෂාවේදී 2023 ජූනි 30 දිනට ප්‍රතිලාභීන් 176 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු එකතුව රු.19,347,350 ක ණය ප්‍රමාණයෙන් රු.10,274,194 ක හිඟ ණය ශේෂයක් පැවතුණු අතර එම ප්‍රතිලාභීන්ගෙන් මාස 09 සිට 15 දක්වා කාල පරාසයක් තුළ කිසිදු වාරිකයක් අයකර නොතිබුණි. | ණය අයකරගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා නීතිමය ක්‍රියාමාර්ග නොගත් සමෘද්ධි කළමනාකරුවන්ගෙන් නිදහසට කරුණු විමසා ඇති බව. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 මැයි 17 දිනැති අංක DSD/HO/MF/2020/05 හා 2021 පෙබරවාරි 17 දිනැති අංක 2021/02 දරන සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත සමෘද්ධි ප්‍රජාමූල බැංකු අරමුදලින් අඩු ආදායම් ලාභී පවුල් වෙත 2020 වර්ෂයේදී එකතුව රු. 357,309,399 ක ප්‍රතිලාභ ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් එම මුදල් ප්‍රතිපූරණය කර නොතිබුණි. | ප්‍රතිපූරණය කර ගැනීමට ඉල්ලීම් කර ඇති නමුත් මුදල් ලැබී නැති බව. | චක්‍ර ලේඛය අනුව ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38(අ) වගන්තියේ අතුරු විධානය පලකළ දිනට අත්පත් කර ගැනීමට අදාළ වන්දි මුදල් | අත්පත් කාර්යයයේදී නොවැලැක්විය හැකි ප්‍රමාදයක් හේතුවෙන් කාලය ගත වී ඇති බව. | වන්දි ගෙවීම ප්‍රමාදවීම වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවිය යුතු වුවත් වර්ෂ 3ක සිට වර්ෂ 10කට වඩා වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වී තිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ඉඩම් හිමියන් 06 දෙනෙකු වෙත රු.5,023,070 ක පොලී මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | | |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක විශ්‍රාම ගිය, වැඩ තහනම්කළ, සේවය අතහැර ගිය හා මිය ගිය නිලධාරීන් 08කගේ එකතුව රු. 853,836 ක හිඟ ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අයකර නොතිබුණි. | ඉදිරියේදී නීතිමය කටයුතු සිදුකිරීමට උපදෙස් ලබා දී ඇති බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 සැප්තැම්බර් මාසයේ දී රත්තොට ප්‍රාදේශීය ලේකම් විසින් රාජකාරි දිනවල බහුකාර්යය සංවර්ධන සහායකයින් 05 ක් කඩවත ප්‍රදේශයේ තම පෞද්ගලික නිවසේ සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කිරීම සඳහා අදාළ තොරතුරු 2021 ඔක්තෝබර් 05 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත යොමුකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර ඒ පිළිබඳ පසුවිපරම් කිරීමක්ද සිදුව නොතිබුණි. | ඉදිරි විමර්ශන කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**4. යහපාලනය**

**මහජනයා වෙත සේවා ඉටු කිරිම**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 01 දින සිට 2023 ජූනි 30 දින දක්වා කාල පරාසය තුළ සමෘද්ධි සහනාධාර, ආබාධිත දීමනා, වකුගඩු දීමනා හා වැඩිහිටි දීමනා ලෙස රු. 735,014,912 ක සහනාධාර මුදල් දිස්ත්‍රික් කාර්යාලයෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවලට යවා තිබුණද, ඒවා ප්‍රතිලාභීන් වෙත ප්‍රේෂණය කිරීමේ දී දින 08 සිට දින 177 දක්වා කාලප්‍රමාදයක් පැවති අවස්ථා 578 ක් පැවතුණි. | මින් ඉදිරියට මෙවැනි ගැටළු ඇති නොවීමට මනා අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යන බව. | ගෙවීම ප්‍රමාදවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු අතර ප්‍රමාදය වැළැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක 2022 හා 2023 වර්ෂවල සිදුවී තිබුණු නිවාස හා දේපල හානි 22 ක් සඳහා තවදුරටත් ගෙවිය යුතු රු. 722,706 ක වන්දි මුදල් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබුණි. | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අක්මුදල් ලද පසු ගෙවීම් කරන බව හා අඹන්ගඟ හා ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉතිරි වන්දි මුදල ගෙවීමට ප්‍රතිපාදන ලැබී නොමැති බව. | අදාල වන්දි මුදල් නියමිත කාලය තුල ගෙවිය යුතු ය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2002 ජූනි 19 දිනැති අංක 2002/01 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අනුව එකම ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරු කලයුතු වුවද දිස්ත්‍රික් සමෘද්ධි අංශයේ නිලධාරින් 33 දෙනෙකු වසර 06 සිට වසර 23 දක්වා කාලයක් අඛණ්ඩව එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා තිබුණි. | මෙම නිලධාරීන් දිස්ත්‍රික්කය තුල ස්ථානමාරු කිරීමට හැකියාවක් නොමැති අතර එය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. |